# තතියො පාඨො

අථ ඛො ආයස්මා රට්ඨපාලො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරං ආදාය යෙන ථුල්ලකොට්ඨිතං තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන ථුල්ලකොට්ඨිතං තදවසරි. තත්‍ර සුදං ආයස්මා රට්ඨපාලො ථුල්ලකොට්ඨිතෙ විහරති රඤ්ඤො කොරව්‍යස්ස මිගාචීරෙ. අථ ඛො ආයස්මා රට්ඨපාලො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය ථුල්ලකොට්ඨිතං පිණ්ඩාය පාවිසි. ථුල්ලකොට්ඨිතෙ සපදානං පිණ්ඩාය චරමානො යෙන සකපිතුනිවෙසනං තෙනුපසංකමි. තෙන ඛො පන සමයෙන ආයස්මතො රට්ඨපාලස්ස පිතා මජ්ඣිමාය ද්වාරසාලාය උල්ලිඛාපෙති. අද්දසා ඛො ආයස්මතො රට්ඨපාලස්ස පිතා ආයස්මන්තං රට්ඨපාලං දූරතොව ආගච්ඡන්තං, දිස්වාන එතදවොච. "ඉමෙහි මුණ්ඩකෙහි සමණකෙහි අම්හාකං එකපුත්තකො පියො මනාපො පබ්බජිතො"ති. අථ ඛො ආයස්මා රට්ඨපාලො සකපිතුනිවෙසනෙ නෙව දානං අලත්ථ, න පච්චක්ඛානං, අඤ්ඤදත්ථු අක්කොසමෙව අලත්ථ. තෙන ඛො පන සමයෙන ආයස්මතො රට්ඨපාලස්ස ඤාතිදාසී ආභිදොසිකං කුම්මාසං ඡඩ්ඩෙතුකාමා හොති. අථ ඛො ආයස්මා රට්ඨපාලො තං ඤාතිදාසිං එතදවොච. "සචෙ තං භගිනි, ඡඩ්ඩනීයධම්මං ඉධ මෙ පත්තෙ ආකිරා' ති.

(රට්ඨපාල සුත්ත - මජ්ඣිමනිකාය)

පදමාලාව

| | | | |
|---|---|---|---|
| උට්ඨායාසනා | (සං) | - | අසුනෙන් නැගිට |
| පදක්ඛිණං | (නා) | - | පැදකුණු |
| සංසාමෙත්වා | (පූ.ක්‍රි) | - | තැන්පත් කොට තබා/ සකසා තබා |
| ථුල්ලකොට්ඨිතං | (ස) | - | ථුල්ලකොට්ඨිත නම් නගරය |
| පක්කාමි | (ක්‍රි) | - | ගියේ ය |
| අනුපුබ්බෙන | (ස) | - | පිළිවෙළින් |
| චරමානො | (කි) | - | හැසිරෙන්නේ |
| තදවසරි | (සං) | - | එතැනට පැමිණියේ ය |
| තත්‍ර සුදං | (නි) | - | එහි දී |
| කොරව්‍යස්ස | (ත) | - | කොරව්‍ය ගේ |
| මිගාචීරෙ | (ස) | - | මිගාචීරයෙහි |
| සපදානං | (ස) | - | ගෙපිළිවෙළින් |
| සකපිතුනිවෙසනං | (ස) | - | තම පියාගේ නිවසට |
| මජ්ඣිමාය | (නා) | - | මැද |
| ද්වාරසාලාය | (ස) | - | ගෙහි සාලයෙහි |
| උල්ලිඛාපෙති | (ක්‍රි) | - | කොණ්ඩය පීරවයි |
| අද්දසා | (ක්‍රි) | - | දුටුවේ ය |

| | | | |
|---|---|---|---|
| **දූරතොව** | **(සං)** | - | දුර දී ම |
| **මුණ්ඩකෙහි සමණකෙහි** | **(ත)** | - | හිස මුඩු කරන ලද ශ්‍රමණයන් විසින් |
| **අලත්ථ** | **(ක්‍රි)** | - | ලැබුවේ ය. |
| **පච්චක්ඛානං** | **(සං)** | - | එපා යැයි කීම |
| **අඤ්ඤදත්ථු** | **(නි)** | - | ඒකාන්තයෙන් |
| **අක්කොසමෙව** | **(සං)** | - | බැනුම් ම |
| **ආභිදොසිකං** | **(නා)** | - | පිළුණු වූ |
| **කුම්මාසං** | **(නා)** | - | පිට්ටු |
| **ඡඩ්ඩෙතුකාමා** | **(කි)** | - | බැහැර කරනු කැමැත්තේ |
| **ආකිර** | **(ක්‍රි)** | - | දමන්න |

අභ්‍යාස

1. 'අක්කොසමෙව අලත්ථ' ඡේදය සිංහලට නගන්න.

2. පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. ආයස්මා රට්ඨපාලො කුහිං චාරිකං පක්කාමි?
ii. රඤ්ඤො කොරව්‍යස්ස මිගාචීරෙ කො වසති?
iii. ආයස්මා රට්ඨපාලො කතරස්මිං කාලෙ පිණ්ඩාය චරි?
iv. ථෙරස්ස පිතා කස්මා අක්කොසි?
v. සො ථෙරො තං ඤාතිදාසිං කිං කථෙසි?

3. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. රට්ඨපාල රහතන් වහන්සේගේ ගම කුමක් ද?
ii. කොරව්‍ය රජුගේ උයනේ නම කුමක් ද?
iii. රට්ඨපාල හිමියන් දුටු පියතුමා පැවසුවේ කුමක් ද?
iv. රට්ඨපාල රහතන් වහන්සේට තම ගෙදරින් නොලැබුණේ මොනවා ද?
v. "ආභිදොසිකං කුම්මාසං" යන්න විස්තර කරන්න.

## කාරක

### හැඳින්වීම

**කරොති කිරියං නිප්ඵාදෙතීති කාරකං, කිරියානිප්ඵත්තිනිමිත්තනත්‍ථො.**

ක්‍රියා නිෂ්පත්තියට නිමිති වීමෙන් ක්‍රියාව නිපදවනුයේ '**කාරක**' නම් වේ. ක්‍රියා නිෂ්පත්තියේ දී ප්‍රධාන වශයෙන් කාරක වන්නේ කර්තෘ ය. අනෙකුත් කාරක අප්‍රධාන වශයෙන් කාරක වන අතර ඒවා ක්‍රියා නිෂ්පත්තියට නිමිත්ත වේ. පාලි භාෂාවේ කර්ම, කර්තෘ, කරණ, සම්ප්‍රදාන, අපාදාන, ආධාර යනුවෙන් කාරක හයක් දැක්වේ.

**කත්තුකරණං ච කම්මං - සම්පදානමථාපරං,**
**අපාදානඤ්ච ඔකාසං - කාරකං ඡබ්බිධං මතං.**

(බාලාවතාරය)

ඡට්ඨී විභක්තිය හා ආලපන විභක්තිය ක්‍රියාසිද්ධියට උපකාර නොවන නිසා කාරක නොවේ. ඒ ඒ විභක්ති මගින් කාරකාර්ථ හෙවත් ක්‍රියාව හා සම්බන්ධ වීම ප්‍රකාශ කෙරෙන අයුරු පහත දැක්වේ.

| විභක්ති | කාරක අර්ථය | සූත්‍රය | උදාහරණ |
|---|---|---|---|
| දුතියා | කර්මාර්ථය | කම්මත්‍ථෙ දුතියා | පුරිසො **රුක්ඛං** ඡින්දති. |
| තතියා | කර්තෘ අර්ථය | කත්තරි තතියා | **බුද්ධෙන** ධම්මො දෙසිතො. |
| කරණ | කරණාර්ථය | කරණෙ තතියා | සො **සකටෙන** ගච්ඡති. |
| චතුත්‍ථී | සම්ප්‍රදානාර්ථය | සම්පදානෙ චතුත්‍ථී | කඤ්ඤා **යාචකස්ස** භත්තං දෙති. |
| පඤ්චමී | අපාදානාර්ථය | අපාදානෙ පඤ්චමී | **රුක්ඛම්හා** ඵලං පතති. |
| සත්තමී | ආධාරාර්ථය | ඔකාසෙ සත්තමී | භූපාලො **පීඨෙ** නිසීදති. |

## උපපද විභක්ති

කිසියම් පදයක් කාරකාර්ථය හැර සමීපව සිටි නිපාත, උපසර්ග, ධාතු ආදි අන්‍ය පදයක් නිසා වෙනත් විභක්ති ස්වරූපයක් ගනී නම් ඒ **'උපපද විභක්ති'** නම් වේ. පාලියෙහි ඇති සාම්ප්‍රදායික වාක් ප්‍රයෝග තේරුම් ගැනීමටත් නිවැරදි හා අර්ථවත්ව වාක්‍ය නිර්මාණයටත් කාරක හා උපපද විභක්ති ඉගෙනීම ප්‍රයෝජනවත් වේ.

**නිපාත යෝගය** - **පිතා පුත්තෙන සහ ගච්ඡති.** (පියා පුතා සමග යයි)
**උපසර්ග යෝගය** - **භික්ඛු ගාමං උපවසති.** (භික්ෂුව ගමේ වෙසේ)
**ධාතු යෝගය** - **පිතා පුත්තං මුද්ධනි චුම්බිත්වා පාඨාලයං පෙසෙසි.**
(පියා පුතාගේ මුදුන සිඹ පාසලට යැවීය)

## දුතියා විභක්තිය

**කම්මත්ථෙ දුතියා - යං කරොති තං කම්මං**

දුතියා විභක්තිය කර්මාර්ථයේ යෙදේ. කර්තෘගේ ක්‍රියාවට යටත් වන්නේ කර්මය යි. යමක් කරයි ද එය කර්මය යි. දුතියා විභක්තිය යෙදෙන කර්මාර්ථ ප්‍රභේද සතරක් බාලාවතාරයෙහි විස්තර කොට තිබේ.

### ඉච්ඡිත කම්ම

කර්තෘගේ කැමැත්තෙන් සිදුකරන කර්ම ඉච්ඡිත කර්ම වේ.

කුමාරො **බුද්ධං** වන්දති (කුමාරයා බුදුන් වඳියි)
උපාසකො **සීලං** රක්ඛති (උපාසකයා සිල් රකියි)

### අනිච්ඡිත කම්ම

කර්තෘගේ අකැමැත්තෙන් සිදුකරන කර්ම අනිච්ඡිත කර්ම වේ.

දහරො **කණ්ටකං** මද්දති. (දරුවා කටුව පාගයි)
කඤ්ඤා **විසං** ගිලති. (කන්‍යාව විෂ ගිලියි)

### ඉච්ඡිතානිච්ඡිත කම්ම

කර්තෘගේ කැමැත්තක් හෝ අකැමැත්තක් නැතිව ඉබේම සිදුවන කර්මය ඉච්ඡිතානිච්ඡිත කර්මය නම් වේ.

වාණිජො **ගාමං** ගච්ඡන්තො **රුක්ඛමූලං** උපසඞ්කමති.
(වෙළෙන්දා ගමට යන්නේ ගසක් මුලට පැමිණෙයි.)
බාලකො ගෙහං ධාවන්තො **සුසානභූමිං** දිස්සති.
(ළමයා ගෙදරට දුවන්නේ සුසාන භූමියක් දකියි.)

### අකථිත කම්ම

ක්‍රියාවෙන් නොකියවෙන කර්ම පදය අකථිත කර්ම නම් වේ. මෙය ද්විකර්මක ධාතු යෝගයේ දී දැක ගත හැකිය. ද්විකර්මක ධාතු නම්, ✓**දුහ**, ✓**යාච**, ✓**රුධි**, ✓**පුච්ඡ**, ✓**භික්ඛ**, ✓**සාසු**, ✓**වච**, ආදිය වේ.

යාචකො **සෙට්ඨිං** ධනං යාචති.
පරාභවන්තං පුරිසං මයං පුච්ඡාම **ගොතමං**

### දුතියා විභක්ති කාරක ප්‍රයෝග

### අච්චන්ත සංයෝගය

කාල, මාර්ග ආදි ප්‍රමාණ වාචක පද ද්‍රව්‍ය, ගුණ, ක්‍රියාවාචී පද සමග ඇතිවන අත්‍යන්ත සම්බන්ධය අත්‍යන්ත සංයෝගයයි. අත්‍යන්ත සංයෝගයේ දී කාලවාචී පද හා මාර්ගවාචී පද දුතියා විභක්තියෙන් සිටි.

නිද : ථෙරො **තෙමාසං** පරිත්තං භණති.
**යොජනං** වනරාජි භවති.

### කර්මප්‍රවචනීයාර්ථය

වෙනත් විභක්තියකින් තිබිය යුතු පදය කර්මයක් බවට පත් කොට කීම කර්මප්‍රවචනීයාර්ථයයි. එනම් **අනු**, **පති**, **අධි**, **උප**, **අන්තරා**, **සමන්තා** ආදි උපසර්ග, නිපාතයන් හා බැඳෙන පද කර්මප්‍රවචනීය වෙයි.

එකං සමයං භගවා අන්තරා ච **රාජගහං** **අන්තරා ච** **නාලන්දං** අද්ධානමග්ගං පටිපන්නො හොති.
භගවා **නෙරංජරං පති** විහරති.
සො අහම්පි ගමිස්සාමි **නගරං මිථිලං පති**.
තං ඛො පන **භගවන්තං ගොතමං** කල්‍යාණො කිත්තිසද්දො **අබ්භුග්ගතො**.
උපමා **මං** පටිභාති.

### ක්‍රියා විශේෂණය දුතියා විභක්තියෙන් තබනු ලැබේ.

**සුඛං** සුපති **සුඛං** පටිබුජ්ඣති.
**දුක්ඛං** සෙති පරාජිතො.
උපසන්තො **සුඛං** සෙති.
අස්සො **සීඝං** ධාවති.

**කාලවාචී පද දුතියා විභක්ති ගනී.**

> අථ ඛො ආයසමා රට්ඨපාලො **පුබ්බණ්හසමයං** නිවාසෙත්වා පත්තචීවරං ආදාය ඵුලලකොට්ඨීතං පිණ්ඩාය පාවිසි.
> (ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල භික්ෂුතෙම **පෙරවරු කාලයේ** හැඳ පාසිවුරු ගෙන පිඬු පිණිස ඵුලලකොට්ඨීතයට පිවිසියේ ය)
> සො **එකදිවසං** වනං පාවිසි. (හෙතෙම **එක්දිනක්** වනයට පිවිසියේ ය)

**තතියා විභක්තිය (කත්තරි ච)**

තතියා විභක්තියෙන් කර්තෘ අර්ථය පැවසේ. අනුක්ත කර්තෘ පදය තතියාවෙන් යෙදේ. කර්තෘ අනුක්ත වන්නේ කර්මකාරක හා භාවකාරක වාක්‍යය වලදී ය.

■ **අනුක්ත කර්තෘ**

අනුක්ත කර්තෘ පදය තතියාවෙන් සිටී.

> **සූදෙන** ඔදනො පච්චතෙ. (**අරක්කැමියා විසින්** බත් පිසනු ලැබේ)
> **බුද්ධෙන** ධම්මො දෙසිතො (**බුදුරදුන් විසින්** ධර්මය දෙසන ලදී)

■ **ප්‍රයෝජ්‍ය කර්තෘ (හෙතුඅත්ථෙ ච)**

ප්‍රයෝජ්‍ය කර්තෘ පදය තතියා විභක්තියෙන් ද සිටියි. අනුන්ගේ මෙහෙයවීමෙන් ක්‍රියාව කරන්නා ප්‍රයෝජ්‍ය කර්තෘ නම් වේ.

> සාමි **දාසෙන** කම්මං කාරෙති. (ස්වාමි තෙමේ **දාසයා** ලවා වැඩ කරවයි)
> සාමණෙරො **බාලකෙන** ථෙරං පඤ්හං පුච්ඡාපෙති.
> (සාමණේර තෙම **ළමයා** ලවා තෙරුන්ගෙන් ප්‍රශ්න අස්වයි)

■ **කිච්ච ප්‍රත්‍යයාන්ත හා යෙදුණු කර්තෘ**

කිච්ච ප්‍රත්‍යාන්ත හා යෙදුණු කර්තෘ පදය ද කර්මකාරක හා භාවකාරකයන්හි වන නිසා තතියාවෙන් යෙදේ.

> **පබ්බජිතෙන** අභිණ්හං **පච්චවෙක්ඛිතබ්බං.**
> (**පැවිදි වූවහු විසින්** නිතර ප්‍රත්‍යවෙක්ෂා කළ යුතු ය)
> කරණීයං **අත්ථකුසලෙන** (**දියුණුවේ දක්ෂයා විසින්** කළ යුතු ය)

### තතියා විභක්ති කාරක ප්‍රයෝග

■ **ක්‍රියාපවර්ගාර්ථය**

ක්‍රියාපවර්ගාර්ථය තතියා විභක්තියෙන් යෙදේ. ක්‍රියාවක් නිමවීමට ගතවන කාලය ක්‍රියාපවර්ගාර්ථය නම් වේ.

ථේරා **නවහි මාසෙහි** සංගීතිං අකංසු.
(තෙරුන්වහන්සේලා **මාස නවයකින්** සංගායනාව කළහ)
නරිස්සරො **තීහි වස්සෙහි** විහාරං නිට්ඨපෙසි.
(රජතෙමේ **වසර තුනකින්** විහාරය නිමකරවීය)

■ **අංගවිකාර අවයවාර්ථය**

යම් ශරීර අවයවයක රෝගී ස්වභාවයක් පෙනේ නම් ඒ විකල අවයවවාචී පදය තතියා විභක්තියෙන් සිටියි.

- සො **අක්ඛිණා** කාණො (ඔහු **ඇසකින්** කණෙකි)
- සො **පාදෙන** ඛඤ්ජො (ඔහු **පයින්** කොර ය)
- සො **සොතෙන** බධිරො (ඔහු **කනෙන්** බිහිරි ය)

■ **කාලාර්ථය**

කාලාර්ථයෙහි තතියා විභක්තිය යෙදේ.

**කාලෙන** ධම්මසවණං - එතං මංගලමුත්තමං
(**සුදුසු කාලයේ** දහම් ඇසීම යන මෙය මංගල කරුණකි)
**තෙන සමයෙන** භගවා විහාරං පාවිසි.
(**එසමයෙහි** භාග්‍යවතුන් වහන්සේ විහාරයට වැඩි සේක)

■ **සහාදි යෝගය**

**සහ, සද්ධිං, සමං,** යන සහාර්ථවත් නිපාත යෝගයේ ද, **විනා, නානා, අඤ්ඤත්‍ර, අලං, කිං** ආදි නිපාත යෝගයේ ද තතියා විභක්තිය වේ.

**සහ භණ්ඩකෙන** චොරං චූළාය ගණ්හන්තී විය මං විප්පකාරං පාපෙය්‍ය.
(**බඩු සමග** සොරා කෙස්වැටියෙන් අල්වා ගන්නියක් මෙන් මා විකාරයට පමුණු වන්නීය)
පඤ්චසතා භික්ඛූ **තෙන සද්ධිං** මග්ගං පටිපජ්ජිංසු.
(පන්සියක් භික්ෂූහු **ඔහු සමග** මගට පිළිපන්හ)

යං කරොමසෙ බ්‍රහමුණො සමං දෙවෙහි මාරිස තදජ්ජ තුයහං කරිස්සාම.
(පින්වත දෙවියන් සමග අපි බ්‍රහ්මයාට යම් වැඳීමක් කරමු ද එය අද පින්වතාට කරන්නෙමු)

## කරණ විභක්තිය

**කරණෙ තතියා - යෙන වා කයිරතෙ තං කරණං**

ක්‍රියාව සිදු කිරීම සඳහා කර්තෘහට අතිශයින් උපකාර වනුයේ කරණය යි.

කරණාර්ථයේ ද තතියා විභක්තිය වෙයි. යමකින් ක්‍රියාව කරණු ලැබේ ද එය කරණය යි.

| | |
|---|---|
| නෙතෙතහි චන්‍දං ඉක්ඛතෙ. | (ඇස්වලින් සඳ බලනු ලබයි) |
| හත්‍ථෙන අඞගුලිං මද්දතෙ | (අතින් ඇඟිලි මඩිනු ලබයි) |
| දාත්‍තෙන වීහිං ලුනාති. | (දෑකැත්තෙන් ගොයම් කපයි) |

## චතුත්ථි විභක්තිය (සමපදානෙ චතුත්‍ථි)

සම්ප්‍රදානාර්ථයේ චතුත්‍ථි විභක්තිය වේ. කර්තෘ පූජා බුද්ධියෙන් හෝ අනුග්‍රහ බුද්ධියෙන් යමෙකුට දීමට කැමති වේ ද, දීමට රුචි වේ ද යමක් දරා ද මෙම දීම්, දැරීම්, හෝ රුචි කිරීම් ලබන්නා දැක්වෙන පදය සම්ප්‍රදාන නම් වේ.

| | |
|---|---|
| සංඝසස චිවරං දදාති. | (සංඝයාට චීවරය දෙයි) |
| සමණසස සච්චං රොචතෙ. | (ශ්‍රමණයාට සත්‍ය රුචි වේ) |
| යඤ්ඤදත්තසස ඡත්තං ධාරයතෙ. | (යඥ්ඥදත්තට කුඩය දරනු ලැබේ) |

**අනිරාකතත්‍තානුමන්‍තාරාධකං සමපදානියං**
**තිධා යථා ජලං දෙති රුක්ඛසස භික්ඛුනො'ත්‍ථිනො**

ආරාධක, අනිරාකත්තු, අනුමන්තු යනුවෙන් චතුත්‍ථි විභක්තිය තෙවදෑරුම් වේ.

■ ආරාධක

යමක් ඉල්ලාගෙන ලබාගන්නා තැනැත්තා ආරාධක නම් වේ.

අතිථිනො ජලං දෙති. (ආගන්තුකයාට ජලය දෙයි)

■ අනුමනතු

නොඉල්ලා ලැබෙන දේ මැනවැයි පිළිගන්නේ අනුමන්තු නම් වේ.

භික්ඛුනො ජලං දෙති. (භික්‍ෂුවට ජලය දෙයි)

■ අනිරාකතතු

නොඉල්ලා දෙන ලද දේ යහපතයැයි අනුමත නො කරයි ද, එහෙත් ප්‍රතික්ෂේප ද නො කරයි නම්, එය අනිරාකත්තු නම් වේ.

රුක්ඛස්ස ජලං දෙති. (ගසට ජලය දෙයි)

■ තාදර්ථය

**පිණිස, සඳහා යන අර්ථය ප්‍රකාශ කරනුයේ තාදර්ථය නම්. එහිදී චතුර්ථී විභක්තිය භාවිත වේ.**

බුද්ධො ලොකානුකම්පාය ධම්මං දෙසෙති
(බුදුරජ ලොවට අනුකම්පා පිණිස ධර්මය දෙසයි)
අහං සීතස්ස පටිඝාතාය චීවරං පටිසෙවාමි
(මම සීතල නැති කිරීම සඳහා සිවුර සේවනය කරමි)

■ **නමො, සොත්ථි නිපාත පද සමඟ චතුර්ථී විභක්තිය වේ.**

| | |
|---|---|
| නමො තස්ස භගවතො. | (ඒ භාග්‍යවතුන් වහන්සේට නමස්කාර වේවා) |
| සොත්ථි තෙ හොතු සබ්බදා. | (සැමදා ඔබට යහපතක් වේවා) |

**පඤ්චමී විභක්තිය (අපාදානෙ පඤ්චමී)**

අපාදාන අර්ථයේ පඤ්චමී විභක්තිය යෙදේ.

**යස්මාදපෙති භයමාදත්තෙ වා තදපාදානං.**

යමකු කෙරෙන් පහ වේ ද, බිය වේ ද, ගන්නේ වේද, කර්තෘගේ පහවීම ආදියට නිමිති වූ පදය පඤ්චමී විභක්තියෙන් යෙදේ.

| | |
|---|---|
| ගාමා අපෙන්ති. | (ගමින් පිට වෙත්) |
| චොරම්හා භායන්ති. | (සොරා කෙරෙන් බිය වෙත්) |
| උපජ්ඣායා සික්ඛං ගණ්හාති. | (ගුරුවරයා කෙරෙන් ශික්ෂාව ගනියි) |

අපාදානාර්ථයේ ප්‍රභේද දෙකකි.

**අචල අපාදානය**
**චල අපාදානය**

■ **අචල අපාදානය**

නොසැලෙන වස්තුවකින් යමක් ඉවත් වේ ද, ඒ අචල අපාදානය යි.

රුක්ඛස්මා ඵලං පතති. (**ගසෙන්** ගෙඩිය වැටෙයි)

■ **චල අපාදානය**

සැලෙන වස්තුවකින් යමක් ඉවත් වේ ද, ඒ චල අපාදානය යි.

ධාවතා අස්සා පුරිසො පතති. (දුවන්නා වූ **අශ්වයා කෙරෙන්** පුරුෂයා වැටෙයි)

**පඤ්චමී විභක්ති ප්‍රයෝග**

■ **උපසග්ග යෝගය**

**අප, ආ, පරා** යන උපසර්ගයන් හා යෝග වූ නාම පඤ්චමී විභක්තියෙන් යෙදේ.

අපසාලාය ආයන්ති වාණිජා (වෙළෙන්දෝ ශාලාව හැරයත්)
ආබ්‍රහ්මලොකා සද්දො අබ්භුග්ගච්ඡති. (**බ්‍රහ්මලෝකය දක්වා** ශබ්දය උස්ව නැගේ)

■ **නිපාත යෝගය**

**අඤ්ඤත්‍ර, ආරකා, උද්ධං, අධො, රහිතා, රිතෙ, විනා** ආදි නිපාත යෝගයේ ඒ හා සම්බන්ධ වන පදය පඤ්චමී විභක්තියෙන් යෙදේ.

උද්ධං පාදතලා අධො කෙසමත්ථකා තචපරියන්තං පූරං නානාප්පකාරස්ස
අසුචිනො පච්චවෙක්ඛති.
අරුණුග්ගමණතො පට්ඨාය කම්මං කරොති.
යාව බ්‍රහ්මලොකා සද්දො අබ්භුග්ගච්ඡි.
මාතුජා රහිතා (සහෝදරයා හැර)
රිතෙ සද්ධම්මා (සද්ධර්මය හැර)
විනා සද්ධම්මා (සද්ධර්මය හැර)

■ **හේත්වර්ථය**

හේත්වර්ථයෙහි පඤ්චමී විභක්තිය යෙදේ.

කාමතො ජායතී සොකො.
කස්මා තුම්හෙ ඉධ වසථ?

**සත්තමී විභක්තිය (ඔකාසෙ සත්තමී)**

සත්තමී විභක්තිය ආධාරාර්ථයේ යෙදේ. යමෙක් ක්‍රියා සිද්ධියට උපකාර වූ කර්තෘ, කර්මයන්ට පිහිට (ආධාර) වේ ද, ඒ ඔකාස නම් වේ.

**ඔපසිලෙසික විසයාභ්‍යාස - බ්‍යාපිකභෙදා චතුධාධාරො**
**වාරිසටෙසු ච සලිලෙ මච්ඡා - සසසං නදියං තිලෙසු තෙලං**

ආධාරය සතර වැදෑරුම් වේ. ඔපසිලේසික, විසය, අභ්‍යාස, ව්‍යාපික ආධාරය වශයෙනි.

■ **ඔපසිලේසික ආධාරය**

යම් ආධාරක වස්තුවක් ආධෙය වස්තුවෙහි ගැටී පවතී ද, එය ඔපසිලේසික ආධාරය නම් වේ.

| | |
|---|---|
| වාරි සටෙසු | (කළයෙහි දිය) |
| රාජා ආසනෙ නිසීදති. | (රජ තෙමේ අසුනෙහි හිඳියි) |

■ **විසයික ආධාරය**

යම් ආධාරක වස්තුව ආධෙය වස්තුවට විෂය වේ ද, විෂයාධාර නම් වේ.

| | |
|---|---|
| සලිලෙ මච්ඡා | (ජලයෙහි මත්ස්‍යයෝ) |
| ආකාසෙ සකුණා චරන්ති. | (අහසේ පක්ෂීහු හැසිරෙත්) |

■ **අභ්‍යාස ආධාරය**

ආධාර වස්තුව ආධෙය වස්තුවට සමීපයෙහි පවතී නම් එය අභ්‍යාසාධාර නම් වේ.

නදියං සසසං (ගඟ සමීපයෙහි ගොයම)
ගංගායං ඝොසො (ගඟ සමීපයෙහි ඝෝෂාව)

■ ව්‍යාපික ආධාරය

යම් ආධාරයක් ආධෙය වස්තුවේ පැතිර පවත්නේ වේද එය ව්‍යාපිකාධාරය නම් වේ.

තිලෙසු තෙලං (තලවල තෙල්)
උච්ඡුසු රසො (උක්වල රස)

**සත්තමී විභක්ති ප්‍රයෝග**

■ ගහ ආදි ධාතු යෝගය

කර්මාර්ථයෙහි ✓ගහ -උපාදානෙ (ගැනීම් අර්ථයෙහි), ✓චුබි (සිඹීමෙහි), අභි+ ✓වදි - අභිවාදනෙ (වැඳීමෙහි) යන මේ ධාතුන්ගේ යෝගයක් ඇති කල්හි සත්තමී විභක්තිය වේ.

බාහාසු ගහෙත්වා (අත් ගෙන)
භික්ඛුසු අභිවාදෙන්ති (භික්ෂූන් වඳිත්)
මුද්ධනි චුම්බිත්වා (හිස සිඹ)

■ සම්ප්‍රදානාර්ථය

සම්ප්‍රදානාර්ථයෙහි ද සත්තමී විභක්තිය වේ.

සංඝෙ දින්නං (සංඝයාට දෙන ලද දේ)
සංඝෙ ගොතමී දෙහි (ගෝතමියනි, සංඝයාට දෙන්න)

■ කාලාර්ථය

කාලවාචක ශබ්ද සත්තමී විභක්තියෙන් ද සිටියි. එය '**කාලසත්තමී**' යනුවෙන් හැඳින්වේ.

පුබ්බණ්හසමයෙ ගතො. (පෙරවරුයෙහි ගියේ ය)
තස්මිං සමයෙ භගවා අවොච. (එකල භාග්‍යවතුන් වහන්සේ කී සේක)

■ භාවාර්ථය

භාව නම් වීමයි. සිංහල භාෂාවේ පැවසෙන 'කල්හි, විට (වසින කල්හි . පැමිණි විට) යනාදි අරුත් පැවසීම සඳහා සත්තමී විභක්තිය යෙදේ. මෙහිදී වාක්‍යයාංශයේ කර්තෘ පදය ඒ හා සම්බන්ධ කිතක පදය ද සත්තමී විභක්තියෙන් තැබීම පාලි රීතිය යි.

බ්‍රහ්මදත්තෙ රජ්ජං කාරෙන්තෙ (බ්‍රහ්මදත්ත රාජ්‍යය කරවන කල්හි)
චොරෙසු ආගතෙසු (සොරු පැමිණි විට)

■ **නිර්ධාරණාර්ථය**

නිර්ධාරණාර්ථයේ හෙවත් ගොඩකින් යමක් වෙන්කර ගැනීමේදී සත්තමී විභක්තිය වේ.

බ්‍රාහ්මණෙසු දෙවදත්තො පණ්ඩිතො (බ්‍රාහ්මණයන් අතර දේවදත්ත පණ්ඩිතයෙක්)

**අභ්‍යාස**

1. සිංහලට නගන්න.

i. සෙනාපති යොධෙහි සද්ධිං නගරම්හා නික්ඛමති.
ii. මුනි සද්දෙහි ගහපතීහි සද්ධිං ගිරිම්හිරූහති.
iii. තෙන ඛො පන සමයෙන ආයස්මතො රට්ඨපාලස්ස පිතා මජ්ඣිමාය ද්වාරසාලාය උල්ලිඛාපෙති.
iv. ආයස්මතො රට්ඨපාලස්ස ඤාතිදාසී ආභිදොසිකං කුම්මාසං ඡඩ්ඩෙතුකාමා හොති.
v. අථ ඛො ආයස්මා රට්ඨපාලො තං ඤාතිදාසිං එතදවොච.

2. පාලිට නගන්න.

i. පින් කරන පුද්ගලයා නිතර නිතර පින් කරයි.
ii. මාලාකාරයා මල් රැස් කර මල් දම් ගොතා විකුණා ජීවත් වෙයි.
iii. මගේ මව උදෙන් ම දානය පිළියෙල කර විහාරයට ගොස් භික්ෂු සංඝයාට පූජා කළාය.
iv. ඔහු ධර්මයේ හැසිරෙන්නේ ය. දුශ්චරිතයෙහි නො හැසිරෙන්නේ ය.
v. බෝධිසත්ත්වයන් වහන්සේ ඇසතු රුකමුල වැඩහිඳ වෙසක් පුන් පොහෝ දින අභිසම්බෝධියට පත්වූහ.

3. කෙටි පිළිතුරු සපයන්න.

i. කාරක යනු මොනවාද?
ii. කාරක වර්ග 06 ලියන්න.
iii. උපපද විභක්ති යනු මොනවාද?
iv. "අච්චන්ත සංයෝගය" යන්න විස්තර කරන්න.
v. "සම්පදානෙ චතුත්ථී" ප්‍රයෝගය සඳහා උදාහරණ 2ක් දෙන්න.

4. පහත සඳහන් වාක්‍යයන්හි කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති ප්‍රයෝගය ලියා සිංහලට නගන්න.

i. **තෙන ඛො පන සමයෙන** ආයස්මා සංගාමජි අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසින්නො හොති.

ii. භගවා **තායං වෙලායං** ඉමං උදානං උදානෙසි.

iii. **පඤ්චහි භික්ඛුනීසතෙහි** සහ ගොතමී නිබ්බානං යාති.

iv. පුත්ත, **හාසකාලෙ උපට්ඨිතෙ** සොචිතුං න යුත්තං.

v. අහං **තාසං සබ්බසං** ජෙට්ඨා අහොසිං.

vi. අඤ්ඤතරො සො පනායස්මා නන්දො **අරහතං** අහොසි.

5. A හි දී ඇති විභක්ත්‍යර්ථයට උචිත යෙදුම් B කොටසින් තෝරාගෙන ලියා දක්වන්න.

| | A කොටස | B කොටස |
|---|---|---|
| i | ක්‍රියා ප්‍රවර්ගාර්ථයේ තතියා | උපාසකා අල්ලවත්ථෙහි අල්ලකෙසෙහි භගවන්තං උපසංකමිංසු. |
| ii | නිර්ධාරණාර්ථයේ සත්තමී | ථෙරා නවහි මාසෙහි සංගීතිං අකංසු. |
| iii | අත්‍යන්ත සංයෝගාර්ථයේ දුතියා | උපසන්නො සුඛං සෙති. |
| iv | සහාදි යෝගයෙහි තතියා | ආචරියො සහ සිස්සෙහි ගච්ඡති. |
| v | ක්‍රියා විශේෂණාර්ථයේ දුතියා | භගවා සත්තාහං එකපල්ලංකෙන නිසීදි. |
| vi | නිර්ධාරණාර්ථයේ ඡට්ඨී | පඤ්චවග්ගියෙසු භික්ඛුසු කොණ්ඩඤ්ඤො පඨමො අරහා අහොසි. |
| vii | ඉත්ථම්භූතාර්ථයේ තතියා | උපාසකො තෙසං අඤ්ඤතරො අහොසි. |
| viii | ද්විකර්මක ධාතුයෝගයෙහි දුතියා | පරාභවන්තං පුරිසං මයං පුච්ඡාම ගොතමං. |
| ix | නමො යොගයෙහි චතුත්ථී | යාචකො කසිරෙන ඝාසච්ඡාදං ලභති. |
| x | ක්‍රියාවිශේෂණාර්ථයෙහි තතියා | නමො තෙ බුද්ධවීරත්ථු. |